වාහනයක් යනු, පුද්ගලයෙකු හට අත්‍යාවශ්‍ය අංගයකි. අලුත් වාහනයක් මිළදී ගැනීමේදී ඕනෑම අයෙකුට මූල්‍ය අවශ්‍යතාවයන් පැනනගී. ඒ අනුව ඔබ මෙතෙක් සිහින දුටු වාහනය සැබැවින්ම හිමිකර දීමේ අරමුණින් සරල කොන්දේසි යටතේ මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත. පෞද්ගලික අවශ්‍යතාවය සඳහා මෙන්ම ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් වාහන මිළදී ගැනීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් ලබාගත හැකිය.

**විශේෂ ප්‍රතිලාභ**

- තරඟකාරී පොලී අනුපාත
- අවම ලියකියවිලි
- මාර්ගගත ක්‍රමයට අයදුම් කිරීමේ පහසුකම

**යෝග්‍යතාව**

- ණයකරු ස්ථිර මාසික ආදායමක් හිමිවැටුප් ලබන්නෙකු/ව්‍යාපාරිකයෙකු/ස්වයං රැකියාවක නියුතු පුද්ගලයෙකු විය යුතුය.
- ණයකරු වයස අවුරුදු 18-60 අතර ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- ණය මුදලේ අවශ්‍යතාවය වාහනයක් මිළදීගැනීම විය යුතු අතර, මිළදීගන්නා වාහනයේ උකස සුරැකුම් වශයෙන් ලබාගත යුතුය. වාහනයේ ලියාපදිංචි සහතිකය බැංකුව නමින් නියඳ කළයුත අතර, ඊට අමතරව වාහනයේ වෙළඳපල වටිනාකම සඳහා බැංකුව නමින් නියඳ කළ රක්ෂණ ඔප්පුව ලබාගත යුතුය.

**පොලී අනුපාතය**

[www.peoplesbank.lk](http://www.peoplesbank.lk) වෙබ් අඩවිය ඔස්සේ තොරතුරු ලබාගත හැක.

**ආපසු ගෙවීමේ කාලය**

උපරිම ආපසු ගෙවීමේකාලය වසර 08 කි. (සිදු කරන ක්‍රමවත් ඇගයීමකන් පසු ආපසු ලියාපදිංචි නොකළ හෝ ලියාපදිංචි කළ වාහන සඳහා ණය ලබාගත හැකිය.)

**ගාස්තු/කොමිස්,පොලී ආදිය**

- ක්‍රමික ආපසු නොගෙවීමකදී, මුල් මුදල සඳහා අය කරන දඩ පොලිය
- හිඟවාරික සඳහා දඩ පොලිය
- නියමිත ලිපි ද්‍රව්‍ය ගාස්තු
- ගිවිසගත් කාලයට ප්‍රථම ණය මුදල ගෙවා අවසන් කිරීමකදී අයකරනු ලබන ණය මුදල කලින් පියවීමේ ගාස්තු (අදාළ නම් පමණක්)
- නෛතික ගාස්තු ( අදාලනම් පමණක්)
- මුද්දර ගාස්තු ( අදාලනම් පමණක්)
- රක්ෂණ ගාස්තු ( අදාලනම් පමණක්)

## අයදුම් කිරීමේක්‍රමය

- **www.peoplesbank.lk** වෙත පිවිස අන්තර්ජාලය හරහා අයදුම් කළහැක.
- නැතහොත් අයදුම්කරුගේ මාස 03 ක වැටුප් පත්‍රිකා/ව්‍යාපාර ආදායම් වාර්තා සමඟ ළඟම ශාඛාව හෝ සේවා මධ්‍යස්ථානය විසින්ත කළයුතුය.

## නියමයන් සහ කොන්දේසි

- ශ්‍රීලංකා රුපියල් වලින් ණය පහසුකම්සළකා බැලිය යුතුය.
- අයදුම්කරුගේ මාසික වැටුප/ණය වාරිකය, මහජන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ගිණුමකට ප්‍රේෂණය කරන බවට සේවා යෝජක වෙතින් ලිඛිත එකඟතාවය ලබාගත යුතුය.
- ණය තොරතුරු කාර්යාංශ වාර්තාවට අනුව, ණය අයදුම්කරු සහ ඇපකරුවන් ණය ගෙවීම පැහැර හරින්නන් නොවිය යුතුය.
- යෝජිත ණය වාරිකය සහ ප්‍රවර්ථන අඩුකිරීම් / ණය බැඳීම් ඇතුළුව මුළු අඩුකිරීම් දළ වැටුපෙන් 60% ක් තුළ විය යුතුය.
- වැටුප් ලබන ණයකරුවන් සඳහා ණය පහසුකමේ ආපසු ගෙවීමේ කාලය විශ්‍රාම වයස දක්වා සළකා බැලිය හැක.

## පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය

- ණයකරු හට info@peoplesbank.lk හරහා පැමිණිල්ල යොමු කළහැක.
- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.
- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ඇමතීම මගින් පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

## වැඩිදුර තොරතුරු

- www.peoplesbank.lk වෙත පිවිසෙන්න
- ඇමතුම් මධ්‍යස්ථානය - 1961
  ප්‍රධාන කාර්යාලය - 0112481481